**දක්ෂිණ මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය (අධිවේගී මාර්ග සම්බන්ධතා වැඩිදියුණු කිරීමේ සැලැස්ම) 2019**

---

දක්ෂිණ මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ (අධිවේගී මාර්ග සම්බන්ධතා වැඩිදියුණු කිරීමේ සැලැස්ම) 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 මැයි 27 දින එළඹි අංක 3028 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මාර්ග සහ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. (අ) වැඩිදියුණු කිරීමේ අවශ්‍යතාවය සඳහා අධිවේගී මාර්ග ජාලය සම්බන්ධ කෙරෙන ජාතික මහාමාර්ග පිරික්සීම (ආ) ශක්‍යතා අධ්‍යයනය, සවිස්තරාත්මක ඉංජිනේරු කටයුතු, ඉඩම් අත්පත්කර ගැනීම සහ නැවත පදිංචි කිරීම, ඉදිකිරීම් කටයුතු ප්‍රසම්පාදනය සඳහා අනාගත ව්‍යාපෘති වැඩසටහන්ගත කිරීම (ඇ) ජාතික මහාමාර්ග කිලෝමීටර් 250 ක පමණ ශක්‍යතා අධ්‍යයනයක් සිදුකිරීම (ඈ) ජාතික මහාමාර්ග කිලෝමීටර් 200 ක පමණ සවිස්තරාත්මක ඉංජිනේරු කටයුතු සිදුකිරීම (ඉ) සැලසුම් ප්‍රමිතීන් සහ ඉදිකිරීම් තාක්ෂණය වැඩිදියුණු කිරීමට සහය වීම (ඊ) අධිවේගී මාර්ග ජාලය සම්බන්ධ කරන ජාතික මහාමාර්ගවල සැලසුම් ක්‍රමවේදය, සැලසුම් ප්‍රමිතීන් සහ ඉදිකිරීම් තාක්ෂණ සැලසුම් පිළිබඳ පුහුණු වැඩ සටහන් ඉදිරිපත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ.ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 790.80 කට සමාන එජඩො මිලියන 6 ක් වන අතර, ඉන් රු.මිලියන 659 කට සමාන එජඩො මිලියන 5 ක් සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 අගෝස්තු 22 දින ආරම්භ කරන ලද අතර, 2019 ජුනි 30 දින වන විට නිම කිරීමට නියමිත විය. කෙසේවෙතත්, 2019 දෙසැම්බර් 31 තෙක් ව්‍යාපෘතියේ කටයුතු නිමකිරීමේ දිනය දීර්ඝ කර තිබුණි.

**1.3 මතය**

---

මාගේ මතය, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනයන් තුළින් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බවයි.

**1.4 මතය සඳහා පදනම**

---

මම මාගේ විගණනය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුව සිදු කරන ලදි. මෙම ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ යෝග්‍ය බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

---

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් වලට අනුකූලව පිළියෙල කිරීම, සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම පිළිබඳ වගකීම ඊට සම්බන්ධ පාර්ශවය විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් හා ක්‍රියාත්මක කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද මුත් අභ්‍යන්තර පාලනයේ සඵලත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත්ව මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනයේදී මා හඳුනාගත් අභ්‍යන්තර පාලනයේ සැලකියයුතු අඩුපාඩු ද ඇතුළුව සැලකියයුතු විගණන සොයාගැනීම් හා අනෙකුත් කරුණු සම්බන්ධයෙන් ඊට සම්බන්ධ පාර්ශවයන් සමඟ මම සන්නිවේදනය කරමි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබද අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු.මිලියන | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දින ණය ගිණුම අවසන් කිරීම හේතුවෙන් එජඩො 74,963.84 කට සමාන රු.මිලියන13.59 ක ණය මුදලක් ආසියානු සංවර්ධන බැංකුව වෙත ආපසු යවා තිබුණි. කෙසේවෙතත්, ඉහත ආපසු යැවූ මුදලෙහි ඇතුලත් එජඩො 238.41 කට සමාන රු.43,222 ක ශ්‍රී ලංකා රජයේ අරමුදල් 2019 වර්ෂයේ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල ණය ගිණුමේ නිවැරදි ලෙස වාර්තාකර නොතිබුණි. | 0.043 | මූල්‍ය ප්‍රකාශන තුල ණය වටිනාකම රු.43,222 කින් වැඩියෙන් දක්වා ඇත. | එකඟ වේ. ජර්නල් වවුචර අංක 16 පිළියෙල කරන විට, මෙය විනිමය අනුපාත වෙනසක් ලෙස සැලකා කෙරීගෙන යන වැඩ ගිණුමට මාරු කරන ලදි. | මූල්‍ය විධිවිධානයන්ගේ ප්‍රභවය මූල්‍ය ප්‍රකාශන වල නිසි ආකාරයෙන් හෙළිදරව් කිරීම අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්ය සාධනය

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ධාරිතා සංවර්ධනය සහ වැඩි දියුණු කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියට සහය වීම සඳහා උපදේශන සේවා සැපයීම යන අරමුණු ළඟාකර ගැනීම සඳහා අධිවේගී මාර්ග සම්බන්ධතා වැඩි දියුණු කිරීමේ සැලැස්ම ව්‍යාපෘතිය 2014 අගෝස්තු මස 22 වන දින ආරම්භ කරනු ලැබිණි. ව්‍යාපෘතිය රු.මිලියන 482.92 ක් වැය කරමින් ජාතික මාර්ග 17 ක කිලෝමීටර් 250.88 ක සහ පළාත් මාර්ග 11 ක කිලෝමීටර් 239.07 ක | මාර්ග සැලසුම්කරණය සඳහා වැය කර තිබුණු පිරිවැය ඵල රහිත බවට පත්ව තිබුණි. | ඔව්.එකඟවේ. සම්පූර්ණ කල සියලු සැලසුම් අවශ්‍ය කටයුතු සඳහා සහ ක්‍රියාත්මක කිරීමට දැනටමත් මාර්ග සංවර්ධන අධිකාරියට භාරදී තිබූ අතර යෝජිත මාර්ගයන්හි සම්පූර්ණයෙන් වාගේ ඉඩම් අත්පත් කර ගැනීම අවශ්‍ය නිසා ප්‍රමාණවත් ඉඩම් කැබලි අත්පත් කරගන්නා තුරු ක්‍රියාත්මක | සැලසුම් නිමකල පසු ඉක්මනින්ම මාර්ග පුනරුත්ථාපන කටයුතු ආරම්භ කිරීම අවශ්‍ය වේ. |

| | | | |
|---|---|---|---|
| ශක්‍යතා අධ්‍යයන හා සවිස්තරාත්මක සැලසුම් නිමකර තිබූ අතර උපදේශක විසින් කාර්යයන් නිමකර සියලු ශක්‍යතා අධ්‍යයන වාර්තා හා සැලසුම් 2016 අගෝස්තු 31 දින මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදී තිබුණි. කෙසේවෙතත්, අදාළ මාර්ගයන්ගේ ඉදිකිරීම් කටයුතු පමාවීම හේතුවෙන් මෙම සැලසුම් වලින් සියයට 90 ක් 2019 දෙසැම්බර් 31 දිනට යල්පැනගොස් තිබුණි. තවද, මාර්ග සංවර්ධන අධිකාරියේ 2018- 2027 වර්ෂ සඳහා මාර්ග සංයුක්ත සැලැස්ම සකස් කිරීමට සහය වීම සඳහා රු.මිලියන 20.94 ක ගාස්තුවක් ගෙවා උපදේශකවරු දෙදෙනෙකුගේ සහය ලබාගෙන තිබූ බව නිරීක්ෂණය විය. කෙසේවෙතත්, මාර්ග සංයුක්ත සැලැස්ම 2019 දෙසැම්බර් 31 වන විටත් නිමකර නොතිබුණි. | | කිරීම ආරම්භ කල නොහැක. කෙසේවෙතත්, සමහර තෝරාගත් මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය විසින් සලකාබලයි. එහෙත්, ඉහත ඉදිකිරීම් ක්‍රියාත්මක කිරීමට අධිවේගී මාර්ග සම්බන්ධතා වැඩිදියුණු කිරීමේ සැලැස්ම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන මෙම ණයෙහි නොමැත. | |

### 3.3. ඌන උපයෝජිත සම්පත්

| විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| 2014 අගෝස්තු 22 සිට බලපැවැත්වෙන පරිදි එජඩො මිලියන 5 ක් සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය ගිවිසුමකට 2014 මැයි 27 දින අත්සන් කර තිබුණේ වුවද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කටයුතුවල ප්‍රමාදය හේතුවෙන් ණය අවසන් දිනය වන 2019 දෙසැම්බර් 31 දිනට එජඩො 791,733 කට සමාන රු.මිලියන 143.53 ක් ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර නොතිබුණි. මීට අමතරව 2019 වර්ෂය සඳහා විදේශ ණය රු.මිලියන 24 ක් සහ ශ්‍රී ලංකා රජයේ අරමුදල් | ව්‍යාපෘතිය විසින් රු.මිලියන 143.53 ක ණය මුදලක් ව්‍යාපෘතියේ විෂය පථයේවූ ඉතිරි වැඩ නිමකිරීමට උපයෝජනය කර නොතිබුණි. | එජඩො මිලියන 5 ක් වන ණය මුදලින් මුළු වියපැහැදම එජඩො 4,208,266.63 ක් වන අතර එය ණය මුදලින් සියයට 84.17 කි. ණය වටිනාකම තුල ණය අවිනිශ්චිතතාවය, පොළිය හා ඇස්තමේන්තුගත ව්‍යාපෘති කළමණාකරණ ඒකක වියදම් ආදිය ඇතුලත්වේ. ඉතිරිය දක්ෂිණ මාර්ග සම්බන්ධතා ව්‍යාපෘතිය වෙත මාරුකර තිබුණි. | ව්‍යාපෘති කාලය තුල විෂය පථයේ සියලු වැඩ නිවැරදිව නිමකිරීමට සැලසුම් කිරීම අවශ්‍ය වේ. |

රු.මිලියන 30 ක් වන මුළු වෙන්කිරීම් වලින් විදේශ ණය රු.මිලියන 6 ක් සහ ශ්‍රී ලංකා රජයේ අරමුදල් රු.මිලියන 29 ක් 2019 වර්ෂය තුලදී රේඛීය අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කෙරෙන වෙනත් ව්‍යාපෘති වෙත මාරු කර තිබුණි. ප්‍රතිඵලයක් ලෙස, සැලසුම් ප්‍රමිතීන් සහ ඉදිකිරීම් තාක්ෂණය වැඩිදියුණු කිරීමට, සැලසුම් ක්‍රමවේදයන්, සැලසුම් ප්‍රමිතීන් සහ ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් ලබාදීමට සහය වීම වැනි ව්‍යාපෘති අරමුණු ව්‍යාපෘතිය විසින් සම්පූර්ණයෙන්ම ළඟාකරගෙන නොතිබුණි.